# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1993 අංක 2 දරන ග්‍රාම සේවා නිලධාරී (පදවි නාමය වෙනස් කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1993 ජනවාරි මස 29 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1993 පෙබරවාරි මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ **ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.**

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.**

---

**කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.**

මිල : ශත 30 යි. **තැපැල් ගාස්තුව : රු. 1.00 යි.**

# 1993 අංක 2 දරන ග්‍රාම සේවා නිලධාරි (පදවි නාමය වෙනස් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1993 ජනවාරි මස 29 වන දින]

එල්. ඩී.—ඕ. 53/90

**ග්‍රාම සේවා නිලධාරි යන පදවි නාමය සහ ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසය යන නාමය වෙනස් කිරීමට ආනුෂංගිකව ලිඛිත නීතියෙහි යම් යම් සංශෝධන කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1993 අංක 2 දරන ග්‍රාම සේවා නිලධාරි (පදවි නාමය වෙනස් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — කෙටි නාමය.

2. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 5 දරන ග්‍රාම සේවක (පදවි නාමය වෙනස් කිරීමේ) පනත නොවන යම් ලිඛිත නීතියක හෝ ලිඛිත නීතියක් යටතේ නිකුත් කරන ලද, සාදන ලද, නියම කරන ලද හෝ බලය පවරන ලද යම් දැන්වීමක, නිවේදනයක, ආඥාපනයක හෝ වෙනත් ලේඛනයක ග්‍රාම සේවා නිලධාරියකු හෝ ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයක් ගැන සඳහන් වී ඇති සෑම පද සම්බන්ධයක දීම, මේ පනත ආරම්භ වන දින සිට "ග්‍රාම සේවා නිලධාරි" සහ "ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසය" යන වචන වෙනුවට "ග්‍රාම නිලධාරි" සහ "ග්‍රාම නිලධාරි කොට්ඨාසය" යන වචන පිළිවෙළින් ආදේශ කරනු ලැබිය යුතු ය. — ග්‍රාම සේවා නිලධාරි යන පදවි නාමය හා ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසය යන නාමය වෙනස් කිරීමට ආනුෂංගිකව ලිඛිත නීතියෙහි හා ලේඛනවල කරනු ලබන සංශෝධන.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. — අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරිය වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.